# නර්තනය - 6 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

**ඒකකය - (5.1.1) ගුරු ගෙදර හා බැඳි සාරධර්ම සුරකිමු.**

**ගුරු ගෙදර පිළිබඳ තොරතුරු**

**අතීතයේ ශිල්ප හැදෑරීම සඳහා නිසි වයස් සම්පූර්ණ කළ දරුවා ගුරුගෙදරට ගෙන ගොස් භාරදීම සිදුවිය. දෙමාපියන් විසින් ගුරුතුමාට දරුවා භාර දුන් පසු ගුරුවරයා යටතේ සියලු ක්‍රියාකාරකම් සිදු කරමින් වරදට දඬුවම් ලැබීම, අණට කීකරු වීම, පිළිවෙළකට වැඩ කිරීම ආදී යහපත් ගුණාංග පුරුදු වෙයි. නර්තනය ප්‍රගුණ කිරීමට ගුරුගෙදරට ගිය ශිෂ්‍යයාට ගුරුතුමා යටතේ පහත සඳහන් කටයුතු ඉගෙනීමට අවස්ථාව ලැබේ.**

- **මුල් කාලයේ ගුරුතුමාගේ බෙරය රැගෙන යාම**
- **වාදනය කිරීමට අවස්ථා ලැබීම**
- **ගුරුතුමාගේ ඇඳුම් ආයිත්තම් සකසා දීම**
- **ගොප්කොළ ඇල්ලීම**
- **සියුම් කැටයම් කැපීම**
- **කවි ගායනා පුහුණුව**







**පසු කාලීනව මේ තත්ත්වය වෙනස් වූ අතර වර්තමානය වන විට අධ්‍යාපනික අවශ්‍යතාවක් ලෙස නර්තනය හැදෑරීමට දරුවන් යොමු විය.**

**ගුරුගෙදර හා සබැඳි නර්තන අධ්‍යාපනයේ චාරිත්‍ර**

1. **ගුරුගෙදරට දෙමාපියන් සමග ගොස් බුලත් හුරුල්ලක් දී නර්තනය හැදෑරීමට දරුවා භාරදීම**
2. **ගුරු නමස්කාරය (ගුරු වන්දනා ගාථා)**
3. **දණ්ඩි කඳට නමස්කාර කිරීම**
4. **වැඩිහිටියන්ට ගරු කිරීම**
5. **වාද්‍ය භාණ්ඩ සහ රංග වස්ත්‍රාභරණවලට ගරු කිරීම**
6. **වැඩිහිටි අනුපිළිවෙළ අනුව ශිල්පීන්ට ගරු කිරීම**

**වර්තමාන සාරධර්ම වර්ධනය**

**පන්ති කාමරයේ දී**

**1. තෙරුවන් නමැදීම**

**2.** පාවහන් ගලවා පංති කාමරයට පිවිසීම
**3.** ගුරුවරයා නමැද ශිල්ප ඇරඹීම
**4.** සාමූහිකව වැඩ කිරීමෙන් නායකත්වයට ගරු කිරීම
**5** වාද්‍ය භාණ්ඩවලට ගරු කිරීම හා නියමිත ස්ථානවල තැබීම

ඉහත අයුරු කටයුතු කරන ශිෂ්‍යයා ශ්‍රී ලාංකේය අනන්‍යතාව ආරක්ෂා වන පරිදි සංස්කෘතිකාංග ආරක්ෂා කිරීමට පෙළඹේ.

## ගුරු වන්දනා ගාථා

වනගතේ පිපි මල් දෙකක්
මෙන් මෙ අප ඇති කළ මවු
පියන් විහාරෙට තැබූ රන් කොතක්
මෙන් ශිල්ප දුන් මගේ ගුරු
තුමන්

වටත් සිටිනා සියලු
මහතුනි දුටත් වරදක්
සමාවන් අදත් මෙම නෙර්තයට
පළමුව වඳිමි මම මගෙ ගුරු
තුමන්

## කාර්ය පත්‍රිකාව

1. ගුරු ගෙදර අධ්‍යාපනයේ ප්‍රයෝජන මොනවාද?
2. ගුරු ගෙදර අධ්‍යාපනය මගින් ඔබ උගත් චාරිත්‍ර 2 ක් හා සාරධර්ම 2 ක් නම් කරන්න.
3. ගුරු වන්දනා ගායනයන් නිවැරදිව ගායනය සඳහා පාඩම් කරන්න.


- උපදේශකත්වය – එස්. එම්. ඩී. පී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)
- ටී. එච්. ප්‍රියන්තා දමයන්ති මිය (බප/ හෝ/ බෝපේ රාජසිංහ මහා විද්‍යාලය)
- එම්. අයෝමා විමලවීර මිය (බප/ හෝ/ පාදුක්ක සිරි පියරතන ම.ම.වි.)
- ඩී.එස්. තරංගා දැරණියගල මිය (බප/ හෝ/ සුහාරතී මහාමාත්‍ය මහා විද්‍යාලය